කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය - (පළමු සෙමෙස්තරය) -2021/2022

**PSC - 3142 - රාජ්‍ය ප්‍රතිපත්ති හා පරිපාලනය**

කාලය : පැය දෙකයි (02)

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.

එක් පිළිතුරකට ලැබෙන උපරිම ලකුණු ප්‍රමාණය විස්සකි (20).

---

1. (අ) රාජ්‍ය ප්‍රතිපත්ති සහ රාජ්‍ය පරිපාලනය යන සංකල්ප කෙටියෙන් අර්ථකථනය කරන්න.

   (ආ) නූතන ජාතියක ආණ්ඩුකරණ ක්‍රියාවලිය තුළ එම සංකල්ප දෙකේ අන්තර් සම්බන්ධය පැහැදිලි කරන්න.

2. "ප්‍රජාතන්ත්‍රවාදී රටවල රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුළ යහආණ්ඩුකරණ සංකල්පය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි." ඔබ මෙම ප්‍රකාශය ඇගයීමට ලක් කරන්නේ කෙසේ ද? සමකාලීන ශ්‍රී ලාංකීය දේශපාලන සහ ආර්ථික අර්බුද පිළිබඳ සැලකිලිමත් වෙමින් ඔබේ පිළිතුර ලියන්න.

3. ඔබ පන්ති කාමරයේදී ඉගෙන ගත් රටක් පිළිබඳ සැලකිලිමත් වෙමින් රාජ්‍ය ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියේදී ව්‍යවස්ථාදායකයේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

4. "සාර්ථක ෆෙඩරල් පාලන ක්‍රමයක් සඳහා විශේෂයෙන්ම බලය බෙදාගැනීමේ විධිවිධානය තුළ සමතුලිත රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයක් අවශ්‍ය වේ." ඔබ කැමති ඕනෑම රටක අත්දැකීම් සමඟ මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

5. බහුත්වවාදී සමාජයක රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සහ රාජ්‍ය පරිපාලනයේ දී ආචාර ධර්ම සහ සංස්කෘතියේ වැදගත්කම පරීක්ෂා කරන්න.

6. පහත සඳහන් ඕනෑම දෙකක් (02) පිළිබඳව සටහන් ලියන්න:

   අ) රාජ්‍ය ප්‍රතිපත්ති සහ නීතිය අතර වෙනස

   ආ) ගෝලීයකරණය සහ ජාතික රාජ්‍ය තුළ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය

   ඇ) රාජ්‍ය පරිපාලනය ට වුඩ්රෝ විල්සන්ගේ දායකත්වය

   ඈ) ලිබරල්කරණ ක්‍රියාවලිය තුළ රාජ්‍ය ප්‍රතිපත්ති

*************************